මගේ අංකය:POST/HQ/OP/IPS/C/253/2022
ජාත්‍යන්තර තැපැල් සේවා අංශය,
තැපැල් මූලස්ථානය,
කොළඹ 01000.
2022.07.26

සහකාර අධිකාරි (විදේශ තැපැල් / ලියාපදිංචි),
සියලු ම ප්‍රධාන තැපැල් ස්ථානාධිපතිවරුන් /තැපැල් ස්ථානාධිපතිවරුන් /උප තැපැල් ස්ථානාධිපතිවරුන්,
සියලු ම නියෝජ්‍ය තැපැල් කාර්යාල නියෝජිතවරුන් වෙත,

**විදේශ තැපැල් ගාස්තු සංශෝධනය 2022**

2022/08/01 දින සිට ක්‍රියාත්මක වන පරිදි විදේශ තැපැල් ගාස්තු සංශෝධනය කර ඇත. සංශෝධිත තැපැල් ගාස්තු 2022/07/19 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මගින් ප්‍රසිද්ධියට පත් කර තිබේ. අදාළ ගාස්තු සංශෝධන සටහන, මේ සමග අමුණා ඇත. ( ඇමුණුම 01)

02. සංශෝධිත නව විදේශ තැපැල් ගාස්තු යටතේ, 2022/08/01 දින සිට කවුළුවෙන් භාර ගන්නා සෑම විදේශ තැපැල් භාණ්ඩයක් සඳහා ම, ගාස්තු අය කිරීමට කවුළු නිලධාරීන් ක්‍රියා කළ යුතුය. එසේම, නව විදේශ තැපැල් ගාස්තු සම්බන්ධව කාර්යාලයට හෝ කවුළුවට පැමිණෙන පාරිභෝගික මහජනයා දැනුවත් කිරීමට සුදුසු වැඩ පිළිවෙළක් යෙදීමට, සියලු ම කාර්ය භාර තැපැල් ස්ථානාධිපතිවරු ක්‍රියා කළ යුතු බව ද දන්වමි.

03. මෙම චක්‍රලේඛය, තැපැල් දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ පල කර ඇති අතර, වෙබ් අඩවියට පිවිසීමෙන් මෙහි පිටපත් බාගත කර ගැනීමට හැකි ය. මුද්‍රිත පිටපත් සැපයීමට ඇති හැකියාව අනුව, ඉදිරියේ දී එම පිටපත් ලබා දීමට කටයුතු කරනු ඇත.

04. තවද, කාර්යභාර තැපැල් ස්ථානාධිපතිවරු තම පාලිත උප තැපැල් කාර්යාල මගින්, විදේශ තැපැල් භාණ්ඩ භාර ගැනීමේ දී, නියමිත නව ගාස්තු අය කිරීමට කටයුතු කර තිබේ ද යන්න සොයා බැලිය යුතුය.

05. සංශෝධිත විදේශ තැපැල් ගාස්තු සඳහන් ඇමුණුම් 01හි දැක්වෙන සියලු රටවල් වෙත, ගුවන් හෝ මුහුදු තැපැල් අවස්ථානුකූලව මතු විය හැකි තත්ත්වයන් මත ක්‍රියාත්මක නොවන බව දන්වමි. ගුවන් හා මුහුදු තැපැල් ක්‍රියාත්මක රටවල විස්තරය, මාසිකව හා අවස්ථානුකූලව නියෝජ්‍ය තැපැල්පති (මෙහෙයුම්) විසින් ප්‍රසිද්ධියට පත් කරනු ඇත. එය https://epay.slpost.lk/ වෙබ් පෝටලයේ පල කරනු ලැබේ. එසේම, ගුවන් තැපැල ක්‍රියාත්මක රටවල් විස්තරයෙහි, ඒ ඒ රටවලට බාර ගැනීම කළ හැකි සේවාවන් මොනවා ද යන්න එම රටවල් ඉදිරියෙන් දක්වා ඇත.

06. **සාමාන්‍ය ගුවන් තැපැල සඳහා ගාස්තු අය කිරීම.**
මේ සඳහා ගාස්තු අය කිරීමේ දී, රටවල් කාණ්ඩ අටකට බෙදා ඇත. ලිපි තැපැල් සේවය යටතේ, ලිපි ලේඛන පමණක් අදාළ ගමනාන්තයන් වෙත භාර ගැනීම කළ යුතු වේ.

07. <u>U-Packet සේවාව ක්‍රියාත්මක කිරීම.</u>

**පෙර පැවති ගාස්තු සංශෝධනයේ (2018.01.01. දින සිට ක්‍රියාත්මක වූ විදේශ තැපැල් ගාස්තු සංශෝධනයේ) දැක්වෙන ගුවන් තැපෑල මගින් යවන කුඩා පැකට්ටු සේවය වෙනුවට, නව ගාස්තු සංශෝධනයේ U-පැකට්ටු (U-Packets) සේවය හඳුන්වා දී ඇත. ලිපි තැපැල යටතේ තැපැල් කරන අයිතමයක භාණ්ඩයක්/ වෙළඳ භාණ්ඩයක්/ වෙළඳ සාම්පල ඇතුළත් කරන්නේ නම්, එක් අයිතමයක උපරිම බර කිලෝ ග්‍රෑම් දෙකක (2kg) සීමාවට යටත් ව, එවැනි භාණ්ඩ සඳහා U-Packet සේවාව ඔස්සේ ගාස්තු අය කල යුතුයි. එම තැපැල් භාණ්ඩ සඳහා, ඔබ වෙත සපයා ඇති UA අක්ෂරය සහිත Barcode අනිවාර්යයෙන් භාවිතා කල යුතු අතර, අදාළ Barcode තොග අධිකාරී (සැපයුම්) වෙතින් අප්‍රමාද ව ලබා ගැනීමට කටයුතු කල යුතු ය. එවැනි තැපැල් භාණ්ඩ සඳහා CN 22 ලේබල නිසි පරිදි පුරවා ඇලවීම අනිවාර්යය වේ. මෙම සේවාව ක්‍රියාත්මක වනුයේ, මාසිකව නිකුත් කරන ගුවන් තැපැල ක්‍රියාත්මක රටවල් විස්තරයෙහි සඳහන් ලිපි තැපැල ක්‍රියාත්මක රටවල් සඳහා පමණි.**

08. මුහුදු තැපැල් සේවය, රටවල් 38ක් වෙත ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර, මුහුදු තැපැල් ගාස්තු සකස් කර ඇත. එහෙත්, අංක 05හි සඳහන් කරුණු අවස්ථානුකූලව වෙනස් විය හැකි ය.

09. <u>**EMS සේවය සඳහා ගාස්තු ගණනය කිරීම.**</u>

2022/08/01 දින සිට ක්‍රියාත්මක EMS ගාස්තු යටතේ, පළමු **කිලෝ ග්‍රෑම් 01න් පසුව සෑම අතිරේක ග්‍රෑම් 500ක් හෝ ග්‍රෑම් 500ක් බැගින් වන කොටසක් සඳහා ගාස්තු අය කිරීමට ක්‍රියා කල යුතු** අතර, මේ මගින් 2018 වර්ෂයේ පැවති ගාස්තු අය **කිරීමේ සංකීර්ණ ස්වාභාවය සරල කිරීමට කටයුතු කර ඇත.**

10. <u>විදේශ පාර්සල් සේවය සඳහා බර සීමාවන්.</u>

ගුවන් හා මුහුදු පාර්සල් සේවාව හා EMS සේවාව සඳහා එක් අයිතමයක (පැකේජයක) උපරිම බර සීමාව කිලෝ ග්‍රෑම් 30කි. නමුත්, සමහර රටවල් විසින් මෙම සීමාවට වඩා අඩු බර සීමාවක් දක්වා ඇත. ඊට අදාළ රටවල නම් හා බර සීමාව ඇමුණුම 02 හි දක්වා ඇත.

**අ/ක :** රංජිත් ආරියරත්න
තැපැල්පති

රාජිත කේ. රණසිංහ
නියෝජ්‍ය තැපැල්පති (මෙහෙයුම්)
රාජිත කේ. රණසිංහ
නියෝජ්‍ය තැපැල්පති (මෙහෙයුම්)

පිටපත්:

1. ලේකම් (මුදල් අමාත්‍යාංශය)
2. ලේකම් (ජනමාධ්‍ය අමාත්‍යාංශය)
3. විගණකාධිපති
4. නියෝජ්‍ය තැපැල්පති (මෙහෙයුම්/ පාලන / සංවර්ධන)
5. සියළුම පළාත්බද නියෝජ්‍ය තැපැල්පතිවරුන්
6. ප්‍රධාන ගණකාධිකාරී
7. ප්‍රධාන අභ්‍යන්තර විගණක
8. පාලක (මෙහෙයුම්) / (විමර්ශන)
9. අධිකාරී (ම.තැ.හු)/ අධ්‍යක්ෂක (මුද්දර කාර්යාංශය) / අධ්‍යක්ෂක (පුහුණු) / අධිකාරී (සැපයුම්)/ තැපැල් මූලස්ථාන සියළු අධිකාරීවරුන් / සහකාර අධිකාරීවරුන් / ගණකාධිකාරීවරුන්
10. සියළුම ප්‍රාදේශීය තැපැල් අධිකාරීවරුන් සහ දිසා පාලන නිලධාරීවරුන්
11. සියළුම දිසාගණකාධිවරුන්
12. ගණකාධිකාරී (මුද්දර)
13. තැපැල් අභ්‍යාස ආයතනවල ප්‍රධාන උපදේශකවරුන්

} කාරුණික දැන ගැනීමට සහ සුදුසු පරිදි කටයුතු කිරීම සඳහා